# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
# பதிவாளர் நாயகம் திணைக்களம்
# REGISTRAR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. RG/AB/13/01/EB (II වෙළුම)

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
**HEAD OFFICE**

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 565

ඔබේ අංකය / உமது இல. / Your No.

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
234/A3, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

දිනය / திகதி / Date 2026.02.20


සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්
ප්‍රධාන කාර්යාලයේ සියලුම අංශ ප්‍රධානීන්
සියලුම කලාප භාර නියෝජ්‍ය/සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්
සියලුම දිස්ත්‍රික් භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්
සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන්

**ලේඛන සහකාර සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය – 2026**

2012.07.26 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ලේඛන සහකාර තනතුරෙහි බඳවා ගැනීම් පරිපාටියේ 08 වගන්තියෙහි වන 8.1 උප වගන්තියේ සඳහන් අමුණුම 03 ප්‍රකාරව, ලේඛන සහකාර II ශ්‍රේණියේ නිලධාරීන් විසින් සමත්විය යුතු දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පැවැත්වීමට තීරණය කර ඇත.

02. එබැවින්, මේ පිළිබඳව ඔබ කාර්යාලයේ සේවයෙහි නියුතු ලේඛන සහකාර II ශ්‍රේණියේ නිලධාරීන් දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වමි. බඳවා ගැනීමේ පරිපාටිය අනුව දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පහත පරිදි ලිඛිත ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. මෙම පරීක්ෂණයට අදාල විෂය නිර්දේශය ඇමුණුම 01 මගින් දක්වා ඇත.

I. ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති (කාලය - පැය 01)
II. මුදල් රෙගුලාසි (කාලය - පැය 01)

03. තවද, ලේඛන සහකාර II ශ්‍රේණියේ නිලධාරීන් වෙතින් ඇමුණුම 02හි සඳහන් අයදුම්පත්‍රය සම්පූර්ණ කර නියමිත විභාග ගාස්තු ගෙවන ලද ලදුපත ද අලවා, ඔබගේ නිර්දේශය ද සමඟ 2026.04.01 දිනට පෙර ප්‍රධාන කාර්යාලය වෙත ලැබීමට සලස්වන ලෙස වැඩිදුරටත් දන්වමි. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ.

එච්.පී.චන්ද්‍රලාල්
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්(පාලන)
දුරකථන - 0112072038
ෆැක්ස් - 0112889493
විද්‍යුත් තැපැල - admin@rgd.gov.lk

අත්/කළේ:- එස්.ජලදීපන්
රෙජිස්ට්‍රාර් ජනරාල්